සියලුම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

# අවසාන වාර පරීක්ෂණය 2024

# ප්‍රායෝගික තාක්ෂණ කුසලතා

**6 ශ්‍රේණිය** **කාලය පැය 2 යි.**

| නම/ විභාග අංකයඃ |
|---|

## I කොටස

- ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.
- අංක 01 - 10 දක්වා වූ ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

01. විසිතුරු පත්‍රික ශාක වර්ගයකි,
(1) උඩවැඩියා (2) ඩේලියා (3) පෙරනියම් (4) දුරන්තා

02. රෝග හා පළිබෝධ පාලනයේ දී යොදාගන්නා පරිසර හිතකාමී ක්‍රමයකි,
(1) පොහොර යෙදීම (2) වසුන් යෙදීම
(3) නිසි වල් මර්දනය (4) පාංශු ජල සංරක්ෂණය

03. පාත්තියේ ම සිටුවිය හැකි භෝගයක් නො වන්නේ,
(1) මෑ (2) රාබු (3) ගෝවා (4) බණ්ඩක්කා

04. එල්ලා වැටෙන ශාකයකි,
(1) වොන්ඩරින් ජු (2) සයිප්‍රස් (3) ගඳපාන (4) මිටි ඉක්සෝරා

05. සයිප්‍රස් නම් ශාකය,
(1) එල්ලා වැටෙන ශාකයකි. (2) කේතු ආකාර ශාකයකි.
(3) කුරු ශාකයකි. (4) වැල් ශාකයකි.

06. පස බුරුල් කිරීමට දායක වන සත්ත්වයා,
(1) පළගැටියා (2) ගොළුබෙල්ලා (3) ගැඩවිලා (4) පත්තෑයා

07. අලංකාර මල් සහිත ශාකයකි,
(1) එපිෂියා (2) ඩේලියා (3) පෙපරෝමියා (4) ඩ්‍රැසීනා

08. නියනට පහරදීම සඳහා භාවිත කරනු ලබන උපකරණයකි,
(1) අතකොළුව (2) අඬුමිටිය (3) ඉස්කුරුප්පු නියන (4) දඬු අඩුව

09. දැව අළු සමඟ මිශ්‍රකර මඳ පවනේ වියළා දින කිහිපයකට පසු සිටුවීම කරනු ලබන්නේ,
(1) බණ්ඩක්කා බීජ (2) දඹල බීජ (3) තක්කාලි බීජ (4) මෑ බීජ

10. ගොළුබෙල්ලා ආහාරයට ගන්නා සතෙකි.
(1) පේර කොළයා (2) ඇටිකුකුළා (3) කටුස්සා (4) ගෙම්බා

- අංක 11 - 15 දක්වා වූ ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර වරහන් තුළින් තෝරා ලියන්න.

(කැරලා / සේදුම් බක්කිය / කුරු / දෙමලිච්චා / කුඩලු / මී මැස්සා)

11. ........................................................................ අලංකාර මල් සහිත ශාකයකි.
12. මිටි ඉක්සෝරා ........................................................................ ශාකයකි.
13. ........................................................ ජනේලය අසල ස්ථානගත කළ යුතු ය.
14. ................................................................................ මිටි ශාකවල ජීවත් වේ.
15. ................................................................................ ලී කොට මත ජීවත් වේ.

- **අංක 16 - 20 දක්වා ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර යා කරන්න.**

| | (අ) | (ආ) |
|---|---|---|
| 16. | ගෙවත්තට සමනලුන් ගෙන්වාගැනීමට වගා කළ හැකි මල් වර්ගය | • ගොටුකොළ |
| 17. | ජීව වසුන් වර්ගයකි. | • බාලොලියා මල් |
| 18. | ආහාර ඇසුරුම් කිරීමට යොදාගනී. | • නූඩ්ල්ස් |
| 19. | තිරිඟුපිටි භාවිතකර නිෂ්පාදනය කරයි. | • ටින් |
| 20. | පලතුරු භාවිතයෙන් සකස් කර කෙළින්ම ආහාරයට ගත හැකි ආහාරයකි. | • ජෑම් |

(ලකුණු 1 x 20 = 20)

## II කොටස

- **පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ. ඉතිරි ප්‍රශ්නවලින් දෙකක් තෝරාගෙන ප්‍රශ්න තුනකට පිළිතුරු සපයන්න.**

01. (1) අජීවී වසුන් සඳහා උදාහරණ දෙකක් ලියන්න.
    (2) රෝපණ ද්‍රව්‍ය යනු මොනවා ද?
    (3) ආහාර යනු මොනවාදැයි කෙටියෙන් හඳුන්වන්න.
    (4) බීජ තවාන් දමා පැළ බෝකර සිටුවිය හැකි භෝග දෙකක් නම් කරන්න.
    (5) භෝග වගාවේදී සැලකිය යුතු කරුණු දෙකක් ලියන්න.

(ලකුණු 2 x 5 = 10)

02. (1) ආහාර ඇසුරුම් ලේබලයක අඩංගු විය යුතු කරුණු 3 ක් ලියන්න. (ල. 03)
    (2) සැකසූ ආහාරවලින් සැලසෙන වාසි 3 ක් ලියන්න. (ල. 03)
    (3) ආහාරයක් සඳහා සුදුසු ආහාර ඇසුරුම් ලේබලයක් සරල ව නිර්මාණය කරන්න. (ල. 04)

(මුළු ලකුණු 10)

03. (1) පහත උපකරණ භාවිත කරනුයේ කුමන කටයුතු සඳහාදැයි ලියන්න. (ල. 03)
        1. බවුතය
        2. පීර
        3. දුනු බෙදුම් කටුව
    (2) ලී මගින් නිමවිය හැකි නිමැවුම් 3 ක් ලියන්න. (ල. 03)
    (3) වැඩකරන පුද්ගලයන් ආරක්ෂාව සඳහා අනුගමනය කළ යුතු ක්‍රියාමාර්ග 4 ක් ලියන්න. (ල. 04)

(මුළු ලකුණු 10)

04. (1) මුළුතැන්ගෙයි ඒකක 3 ක් නම් කරන්න. (ල. 03)
    (2) විවේක කාලය ස්වයං රැකියාවක් සඳහා කැපකිරීමෙන් ලැබෙන ප්‍රතිලාභ 3 ක් ලියන්න. (ල. 03)
    (3) නුසුදුසු තත්ත්වයට පත් වූ ආහාරයක දැකිය හැකි වෙනස්කම් සඳහා හේතු වූ භෞතික හේතු 2 ක්, ජීව විද්‍යාත්මක හේතුවක් සහ රසායනික හේතුවක් බැගින් ලියන්න. (ල. 04)

(මුළු ලකුණු 10)

05. (1) විධිමත් හා අවිධිමත් හැඩ 2 බැගින් අඳින්න. (ල. 04)
    (2) මුදල් තැන්පත් කළ හැකි මූල්‍යමය ආයතන 3 ක් ලියන්න. (ල. 03)
    (3) ලාභ ලැබීමේ අරමුණින් තොර ව පවත්වාගෙන යනු ලබන ආයතන 3 ක් ලියන්න. (ල. 03)

(මුළු ලකුණු 10)

- **ප්‍රායෝගික පරීක්ෂණය සඳහා ලකුණු 50 කි.**

**2024 - අවසාන වාර පරීක්ෂණය - ප්‍රායෝගික තාක්ෂණ කුසලතා - 06 ශ්‍රේණිය පිළිතුරු පත්‍රය**

I කොටස

| | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| (01) | 4 | (02) | 3 | (03) | 4 | (04) | 1 | (05) | 2 | (06) | 3 | (07) | 2 | (08) | 1 |

(09) 3 (10) 2 (11) කුඩලු (12) කුරු (13) සේදුම් බක්කිය (14) දෙමලිච්චා

(15) කැරලා (16) බාලොලියා මල් (17) ගොටුකොළ (18) ටින් (19) නූඩ්ල්ස්

(20) ජෑම් (ලකුණු 1 x 20 = 20)

II කොටස - පිළිතුරු

01. (1) ජීවී - බතල, ගොටුකොළ, රටකජු
    අජීවී - ලී කුඩු, පොල් අතු, කෙසෙල් පත්‍ර
  (2) සිටුවීම සඳහා සකස් කරගන්නා ශාක කොටස් රෝපණ ද්‍රව්‍ය වේ.
  (3) ශරීරයේ මනා වර්ධනය, ශරීරයට අවශ්‍ය ශක්තිය ලබාගැනීම සඳහා ශරීරයට ආරක්ෂාව සැපයීම සඳහා ඉවහල් වන පෝෂ්‍ය පදාර්ථ ශාකමය හෝ සත්ත්වමය වශයෙන් පවතින පරිභෝජනයට සුදුසු ද්‍රව්‍ය වේ.
  (4) ගෝවා, වම්බටු, මිරිස්, තක්කාලි
  (5) සෙවණ ලබාදීම / ජලය සැපයීම / භෝග හානි වළක්වා ගැනීමට කටයුතු කිරීම

02. (1) ආහාරයේ අඩංගු බර / අන්තර්ගත ද්‍රව්‍ය / මිල / භාවිත කිරීමට උපදෙස් / කල් ඉකුත්වීමේ දිනය / ප්‍රමිති සහතිකය
  (2) පිළියෙල කිරීම පහසු වීම / රැගෙනයාම පහසු වීම / ගබඩා කිරීම පහසු වීම / ආහාරවල විවිධත්වයක් පැවතීම
  (3) නිවැරදි පිළිතුරුවලට ලකුණු ලබාදෙන්න.

03. (1) බවුතය - මෘදු පෑස්සීම සඳහා භාවිත කරයි.
    පීර - ලෝහ හැඩගැන්වීමට භාවිත කරයි.
    දුනු බෙදුම් කටුව - ලෝහ මත වෘත්තාකාර හැඩ ඇඳීමට භාවිත කරයි.
  (2) අල්මාරිය / පුටු / මේස / ඇඳ
  (3) භාවිත කරන අත් ආවුද පිළිබඳ ව නිවැරදි අවබෝධය / උපකරණ පිළිබඳ ව ශිල්පීය ක්‍රම අනුගමනය කිරීම / ආරක්ෂිත උපකරණ පැලඳ සිටීම / කාර්යයට උචිත ඇඳුම් ඇඳීම

04. (1) ගබඩා කිරීමේ ඒකකය / ආහාර පිසීමට පෙර සැකසීමේ ඒකකය / පිසීමේ ඒකකය
  (2) කාලය ප්‍රයෝජනවත්ව ගතකිරීම / අමතර ආදායමක් ලබාගත හැකි වීම / මානසික සතුටක් අත්කර ගැනීමට හැකිවීම
  (3) භෞතික හේතු - තැළීම, පොඩිවීම, උෂ්ණත්වයට භාජනය වීම
    රසායනික හේතු - තෙල් මුඩුවීම
    ජීව විද්‍යාත්මක හේතු - යීස්ට් / දිලීර / ක්ෂුද්‍ර ජීවීන්ගේ ක්‍රියාකාරීත්වය / ගුල්ලා / මීයන් / කැරපොත්තන් හානි කිරීම

05. (1) නිවැරදි පිළිතුරු සඳහා ලකුණු දෙන්න.
  (2) වාණිජ බැංකු / සමෘද්ධි බැංකු / මූල්‍ය සමාගම් / සමුපකාර ග්‍රාමීය බැංකු
  (3) රජයේ රෝහල් / සමුපකාර සමිති / ක්‍රීඩා සමිති / අධිකරණ ආයතන / රජයේ පාසල්

- **ප්‍රායෝගික පරීක්ෂණය සඳහා ලකුණු 50 කි.**